# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## අධිකරණ සංවිධාන (සංශෝධන)

**1978 අංක 2 දරන අධිකරණ සංවිධාන පනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි**

---

අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යතුමා විසින්
2026 අගෝස්තු මස 18 වන දින ඉදිරිපත් කරන ලදී

(ගැසට් පත්‍රයේ පළ කළේ 2026 අගෝස්තු මස 07 වන දින)

මුද්‍රණය කිරීමට පාර්ලිමේන්තුව විසින් නියෝග කරන ලදී

---

[77 වන පනත් කෙටුම්පත]

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී
කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිල දී ලබාගත හැක

**මිල : රු. 29.00** **තැපැල් ගාස්තුව : රු. 150.00**

මෙම පනත් කෙටුම්පත www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

**නීතිය බලපෑමේ ප්‍රකාශය**

***2 වන වගන්තිය :*** මේ වගන්තිය මගින් (මෙහි මින්මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) 1978 අංක 2 දරන අධිකරණ සංවිධාන පනතේ 4 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි එම වගන්තියේ නීතිය බලපෑම වනුයේ මහාධිකරණයේ විනිශ්චයකාරවරුන් සංඛ්‍යාව එකසිය විසිදෙනකු දක්වා වැඩි කිරීම වේ.

***3 වන වගන්තිය :*** මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 6 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි එම වගන්තියේ නීතිය බලපෑම වනුයේ මහාධිකරණ විනිශ්චයකාරවරයන්ගේ සහ මහෙස්ත්‍රාත්වරයන් ඇතුළුව අනෙකුත් සියලු විනිශ්චයකාරවරයන්ගේ විශ්‍රාම ගත යුතු වයස වැඩි කිරීම වේ.

එල්. ඩී. -ඕ. 25/2026

**1978 අංක 2 දරන අධිකරණ සංවිධාන පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:-

**1.** මේ පනත 2026 අංක        දරන අධිකරණ සංවිධාන (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය

**2.** (මෙහි මින්මතු ''ප්‍රධාන ප්‍රඥප්තිය'' යනුවෙන් සඳහන් කරනු ලබන) 1978 අංක 2 දරන අධිකරණ සංවිධාන පනතේ 4 වන වගන්තියේ (අ) ඡේදයේ ''එකසිය දහයකට වැඩි නොවන්නා වූ ද, විනිශ්චයකාරවරයන්ගෙන්;'' යන වචන වෙනුවට ''එකසිය විසිදෙනකුට වැඩි නොවන්නා වූ ද, විනිශ්චයකාරවරයන්ගෙන්;'' යන වචන ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ. 1978 අංක 2 දරන පනතේ 4 වන වගන්තිය සංශෝධනය කිරීම

**3**. ප්‍රධාන ප්‍රඥප්තියේ 6 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:- ප්‍රධාන ප්‍රඥප්තියේ 6 වන වගන්තිය සංශෝධනය කිරීම

(1) එහි (3) වන උපවගන්තියේ, ''අවුරුදු හැට එක'' යන වචන වෙනුවට ''අවුරුදු හැට තුන'' යන වචන ආදේශ කිරීමෙන්; සහ

(2) එහි (4) වන උපවගන්තිය ඉවත් කර, ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන්:-

''(4) (355 වන අධිකාරය වූ) රජයේ හා අධිකරණ නිලධරයන් (විශ්‍රාම ගැන්වීමේ) ආඥාපනතේ පටහැනිව කුමක් සඳහන් වුව ද, එය නොතකා, වෙනත් සියලුම විනිශ්චයකාරවරයන් සහ මහෙස්ත්‍රාත්වරයන් විශ්‍රාම ගත යුතු වයස අවුරුදු හැට දෙක විය යුතු ය.''.

PL 15910 - 342 (2026/08)

**4**. මේ පනතේ සිංහල හා දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව